

# මංගල දැන්වීම් තීරය

හැඟුම් නැති -ආදරය නැති
පත්තර කරදාසියේ
මුද්‍රිත අකුරු මැද
සිටිත්

මනාලියෝ
රූමතියෝ කුල කුමරියෝ
දෑ කුල ගොත් ද යහමින්
ඔසවා ගෙන වැරෙන්
ගේ දොර ඉඩ කඩම්
කාසි මලු කන කර රනින්
පුරවා ජීවිතය
කී නොකී
යුගල පද වලින්
ගර්වයෙන් පිම්බුනු
අකුරු මැද තෙරපෙමින්
හෙම්බත්ව
ආතුරව

සොයති
සුදු කර පටිම
යුගල පදම

මනාලයෝ
සුර දූතයෝ පින් වන්තයෝ
සුරාවෙන් සූදුවෙන්
නොකැළැල්ය දුසිරිතෙන්
නැණ ගුණ ද ඇති පමණ
වරදට වුව සමාව
සොයති
පින්වත් කුමරියන්
ආදේශ කරති
යුගල පද වලට
යුගල පදම

ඇරයුම් කරති
තනනට
ජීවිතය
යුගල පදවලින්
සොහොන් කොට
ආදරය.

-ප්‍රශංසනී පරණවිතාන -

# සුභාෂිතයෙන්

පින්මද පුතුන් සියයක් ලදුවත් නිසරු
ගුන නැන බෙලෙන් යුතු පුතුමය ඉතා ගරු
එක පුන් සඳින් දුරු වෙයි ලොව ගණ අඳුරු
නෙක තරු රැසින් එලෙසට නොම වේයදුරු

**පදාවලිය (පද ආවලිය)**
පින් මද පුතුන් යහපතක් හෝ සියයක් ලදුවත් වැදගම්මක් නැත, ඉතා ගරු (වනුයේ) ගුන නැන බෙලෙන් යුතු පුතුම ය එක (ම එක) පුන් සඳින් ලොව ගණ අඳුරු දුරු වෙයි නෙක තරු රැසින් එ ලෙසට අඳුරු ඳුරු නො වේ ම ය

**නෙක තරු රැසින්** ‸ නොයෙක් තරු රාසියකින්,
**ගුන නැන බෙලෙන්** ‸ ගුනයෙන් නුවනින් සහ බලයෙන් (බලූ එන්)
‸ බලෙන් - බෙලෙන් වේ.
එය ස්වර සාම්‍යය-පූර්ව රූප සන්ධිය යන නම්වලින් හැඳින්වේ. (මිහි) තෙලෙන් (තලෙන්) වෙනෙහේ (වනෙහි - වනේ) .පෙදෙන් (පදෙන්) නිදසුන් වේ.

පින් අඩු පුතුන් සියදෙනෙකු ලැබුවත් වැඩක් නැත. බොහෝ වැඩවත් වන්නේ ගුණයෙන් නුවණින් සහ සවියෙන් යුතු පුතාමය. (එය හරියට ම) කොතරම් තරු තිබුණත් එකම එක හඳෙන් මෙන් ලෝකයට එලිය නොලැබෙන්නාක් මෙනි.

අප්පෙකුට දරුවන් සියයක් ලැබුනත් අම්මකට එය ලැබිය නොහැක. අප්පෙකුට උවද 'පුතුන් සියයක්' ලැබීම සඳහා දරුවන් දෙ-තුන් සියයක් සිටිය යුතුය. සඳෙන් එලිය ලැබෙන්නේ ලොවින් අඩකට - කොටසකට පමනි.


තිසර FM 97.4
FM 97.4
සෙනසුරාදා පව 1 සිට 5 දක්වා
ඔබට පිදෙන සාර සංග්‍රහය

නැවුම් පුවත් හරවත් සාහා ඕහ
දෙස් විදෙස් කාලීන සිද්ධීන් මියුරු සංගීතය
ලක් හඬ FM 97
සෑම ඉරිදාවකම
දහවල් 10.00 සිට 12.00 දක්වා
ඔබේ හඬ - ලක් හඬ


රංජිත් රූබි සමඟ පැය තුනක් විනෝදය සහ නැවුම් ගීත සමගින් සෑම ඉරිදාවකම රාත්‍රී 8 ට හමුවෙමු
Voice of Lanka
97.7FM 3SER

ශ්‍රී ලාංකේය මාධ්‍ය කවුලුව
ගොඩවන්න
www.thisara.com


## Under Tone

(අප්‍රකාශිත හැඟුම)

මටවත් නොදැනම
හදවතේ ගැඹුරක
ඔබ කෙරේ උපන් ප්‍රේමය
නොපෙනෙන්නට
නොදැනෙන්නට
නොරිදෙන්නට
හදවතේ ගැඹුරුම පත්ලක
සදාකල් කිඳවන්න කිඳවන්න
හදවත පුපුර පුපුරා
උඩටම එන හැටි..

නයෝමි සමුද්‍රිකා

වසන්තය අබියස
පිපෙයි සියළු මල්
කුරුල්ලෙකු ගී ගයන
උදෑසනකි හිත තුළ..

## අම්මා

ළා සඳ පහනක පහසින්
සුවය සදන අම්මා
සපුමල් කැකුළක් පූදින
සුවඳ ගෙනෙන අම්මා

දරු සෙනෙහස තුරුළු කරන්
සදා නොවන නිම්මා
අප ජීවිත සරු කරන්න
යහමග වෙත නම්මා

බුදු කරුණා ගුණ සිසිලස
මා හද වෙත දැම්මා
මගෙ ජීවිත ගංගාවේ
සිළිලාරය අම්මා

ගුණවත්කම බබළවන්න
හොඳ මිනිසුන් ගාවා
දිවා රෑ යේ වෙහෙස වෙවී
මට මං පෙත පෑවා

කල ගුණ දත් පුතකු වගේ
ඔබ පා යුග නාවා
මගෙ හද පුදසුන මත ඔබ
සුදු නෙළුමක් වේවා !!

මල්ලිකා නිමලරත්න

## සැඟවුණු රහස

මිරිඟුවක්ය ඔබ මා දෑස් රවටන
සිනහවක් නොව කඳුළක්ය මා රිදවන
පෙම් දැහැනේ නටඹුනක්ය හදවත පාරවන
මායා බන්ධනයක්ය සසරේ සැරි සරන

සිතක ඉකිබිඳුම වැටහෙන දිනයෙක ඔබට
සිත ඔබෙ දවාලයි දුන් ඒ ගින්දරට
මුසා බසින් හද ගැබ පෑරුවට
නොමවන්න චරිතයක් බියගුළු නිවට

සෙනෙහෙන් පිදූ පූජා සිත කොතැනකදෝ
මිමිණූ පෙම් වදන් අද නිහඬව ඇයිදෝ
දෙහදක් වෙන් කෙරූ බලවේගය කිමදෝ
මේ අප ලද්දෙ දෙවියන්ගේ සාපයදෝ

වරම් ලද දිනෙක යළි අප හමු වේවී
ගො හදවතේ පිටු එකිනෙක පෙරළේවී
සැඟවූ රහස ඔබ මා හට පවසාවී
එදවස එන තුරා ඔබ මගෙ සිහිනය වේවී

කාන්ති වික්‍රමසූරිය


GATEWAY
LAWYERS

Advice on Legal Matters
Business & Commercial
Conveyancing - Sale or Purchase of Houses, Vacant Land, Units, Flats, Shops, Factories & Farms
General, Medical or Enduring Powers of Attorney
Wills & Estate Planning

Professional, Quality Service Assured

Senanie Kurukularatne LL.B, Grad Dip.LP
Barrister & Solicitor
Attorney -at- Law - Sri Lanka

Phone : 03 87869682
Fax : 03 87869681
Mobile : 0414 660 513
Email : gateway5@bigpond.net.au
17, Glenview Rise, Berwick, VIC 3806 Austraila